# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1955/6 - 2016 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා - 2016.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාත් සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය අංක 01/2015

උතුරු පළාතේ පළාත් සභාව විසින් 2016 වසරේ ජනවාරි මස 12 වැනි දින අනුමත කරන ලද 2015 වසරේ අංක 01 දරන උතුරු පළාත් සෞඛ්‍ය සේවා ප්‍රඥප්තියට උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් 2016 වසරේ පෙබරවාරි මස 08 වැනි දින අනුමැතිය ලබාදී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. තෙයිවේන්ද්‍රම්,
ලේකම්,
සභාලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2016 පෙබරවාරි මස 19 වැනි දින,
සභාලේකම් කාර්යාලය,
ඒ 9 පාර,
කයිතඩි.

### සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය

උතුරු පළාතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන සැලසීම උතුරු පළාතේ ජනතාවගේ සෞඛ්‍ය නැංවීම සහ ආරක්ෂා කිරීම සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් විධිමත්ව අඛණ්ඩව විධිවිධාන සැළසීම සහ ඊට අනුෂාංගික සහ අන්තර් කාලීන ප්‍රයෝජනවත් වූ සියලු කාර්යයන් සඳහා විධිවිධාන සැළසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

1952 අංක 12 දරන සෞඛ්‍ය සේවා පනත සමග මෙම ප්‍රඥප්තිය අනනුකුල වේ.

උතුරු පළාතේ පළාත් සභාව විසින් පහත දැක්වෙන පරිදි නීති සම්පාදනය කරනු ලැබේ.

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1 මෙම ප්‍රඥප්තිය 2015 අංක 01 දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය ලෙස ගෙන හැර දැක්විය හැකි වන අතර එයට ආණ්ඩුකාරවරයාගේ එකඟතාවය ලැබෙන දින සිට ක්‍රියත්මක විය යුතුය.

*1 කොටස*

**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සහ එහි ව්‍යවස්ථාව සහ වගකීම්**

උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම

2 (1) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් ලෙස (මින් පසු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලැබේ) පිහිටු විය යුතු අතර මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන වලට අනුව එය පරිපාලනය කරනු ලැබේ.

(2) දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන්ගේ පත්වීම්, ස්ථාන මාරුවීම් සහ විනය පාලනය යනාදියෙහි බලතල (සියලුම ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ නිලධාරීන් හැර) 1987 අංක 42 දරන පනතින් සංශෝධිත පළාත් සභා පනතේ iv වැනි කොටසට අනුව ආණ්ඩුකාරවරයාට හිමිවේ.

උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කාර්යයන්.

3 දෙපාර්තමේන්තුවේ කාර්යයන් ලෙස පහත දෑ සළකනු ලැබේ.

(අ) මෙම ප්‍රඥප්තියේ උපලේඛනයේ සඳහන් මහ රෝහල් (මධ්‍යම රජයේ බලසීමාවට අයත් ශික්ෂණ රෝහල් සහ විශේෂ අවශ්‍යතාවයන් සඳහා ස්ථාපිත කරන ලද රෝහල් හැර) ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාස, ඖෂධ ශාලා යනාදිය ස්ථාපිත කිරීමටත් පරිපාලනය කිරීමටත් සහ නඩත්තු කිරීමටත් ;

(ආ) මහජන සෞඛ්‍යයත්, සෞඛ්‍ය ගැටලුත්, පවුල් සුහසාධනය, ගර්භනී සහ ළමුන් රැකබලා ගැනීම, ජලය සහ ආහාර, පාසල් සෞඛ්‍යයත්, වැඩිහිටි සෞඛ්‍යයත් සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, පරිසරය සහ පාරිසරික සෞඛ්‍ය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ සේවාවන් ලබාදීමේ අරමුණ සඳහා අවශ්‍ය වන්නාවූ මෙම ප්‍රඥප්තියේ උපලේඛනයේ ඇතුළත් ආයතන ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම ;

(ඇ) පළාත් සෞඛ්‍ය නැංවීමේ සැළසුම් සහ පළාත සඳහා වූ වාර්ෂික සෞඛ්‍ය සැළසුම් ක්‍රමවත් කිරීම සහ ක්‍රියත්මක කිරීම ;

(ඈ) උප වගන්ති (අ) සහ (ආ) හි සඳහන් කරන ලද රෝහල් සහ අනෙකුත් මධ්‍යස්ථාන සඳහා සියලු පහසුකම් ලබාදීම (ඖෂධ වර්ග හැර) ;

(ඉ) දෙපාර්තමේන්තුව සහ උප වගන්ති (අ) සහ (ආ) වල සඳහන් කරන ලද රෝහල් සහ මධ්‍යස්ථාන මගින් සපයන සේවාවන්හි අවශ්‍යතාවය සපුරාලීමට අවශ්‍ය වන්නාවූ තනතුරු සංඛ්‍යාව හඳුනා ගැනීම සහ තනතුරු සංඛ්‍යාවට කළයුතු සංශෝධන නිර්දේශ කිරීම ;

(ඊ) දෙපාර්තමේන්තුවට අයත් සියලුම නිලධාරීන් සඳහා කුසලතා වර්ධන පුහුණුවීම් ලබාදීම ; සහ

(උ) දෙපාර්තමේන්තුවේ කාර්යන් නිසිලෙස ඉටුකිරීම සඳහා වූ පහසුකම් ඇති කිරීමටත් අනෙකුත් විෂයන් සාමාන්‍ය පරිදි ඉටුකිරීම.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

4 (1) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයෙකු සිටිය යුතු අතර, (මින් පසු "පළාත් අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලැබේ) ඔහු උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන අතර ලේකම්ගේ අධීක්ෂණය සහ මග පෙන්වීම යටතේ මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (මින් පසුව "සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලැබේ) පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් (මින් පසු පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ පරිපාලන යනුවෙන් සඳහන් කරනු ලැබේ) යන අය පත්කල හැකි අතර ඔහු පළාත් අධ්‍යක්ෂවරයාගේ රාජකාරි යුතුකම් සහ වගකීම් ඉටුකිරීම සඳහා ඔහුට සහාය දැක්විය යුතු ය.

5 (1) යාපනය, කිලිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම ප්‍රදේශ සඳහා පිළිවෙලින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල පහක් තිබිය යුතු ය. ප්‍රාදේශීය සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ.

(2) පළාත් අධ්‍යක්ෂකගේ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ මෙම ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන තමන්ට අයත් ප්‍රාදේශීය බල ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේ දී එක් එක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වේ.

6 පළාත් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා විසින් ඉදිරි වර්ෂය සඳහා පළාත් සෞඛ්‍ය වැඩ සටහන සම්පාදනය කිරීමට පහසුකම් සැලසිය යුතුය. වාර්ෂික සෞඛ්‍ය සැලැස්ම.

(අ) භූමි ප්‍රදේශයට අයත් ජනගහනයේ වර්ධනය;

(ආ) රෝග ව්‍යාප්තවීම ;

(ඇ) මහජනතාවගේ පෝෂණ මට්ටම ;

(ඈ) සෞඛ්‍ය කෙරෙහි පරිසරයේ බලපෑම ; සහ

(ඉ) පවතින ප්‍රවාහන පහසුකම් ;

ඉදිරි වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය යැයි යෝජනා කරන ලද සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම්වල විස්තර සටහනක් මෙම වැඩසටහනේ ඇතුළත්වනු ඇත.

(2) පළාත් අධ්‍යක්ෂ විසින් පළාත් සෞඛ්‍ය සැලසුම ලේකම්වරයාටත්, ලේකම්වරයා විසින් ඉන් පසුව, පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාවට අවධානය සඳහා ඉදිරිපත් කළ යුතුය. පළාතේ සෞඛ්‍ය සේවාව සැපයීම සඳහා ලේකම්වරයා අදහස් කරනු ලබන සහ පළාත් සෞඛ්‍ය සේවා උපදේශක කමිටුවෙන් අවධාරණය කරන ලද කරුණු ඇතුළත් කිරීම සඳහා ඔහු අදහස් කරන දේ ඇතුළත්ව මෙම සැලැස්ම අදාළ වර්ෂයට පෙර වර්ෂයේ නොවැම්බර් මස 30 වැනි දිනට (තිහට) පෙර අනුමත කරනු ලැබිය යුතු ය. ඉන් පසුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්ෂික සෞඛ්‍ය සැලැස්ම සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩලයට ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව ඉහත දැක්වූ පරිදි අදාළ වර්ෂයේ පළාත් සෞඛ්‍ය සංවර්ධන සැලැස්මේ සඳහන් නොවන සංවර්ධන හෝ ඉදිකිරීම් කටයුතු කුමක් වුව ද, එම වර්ෂයේ ක්‍රියාත්මක කළ නොහැකි ය.

7 පසුගිය වසරේ මහජන සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව වාර්තාවක් එක් එක් වර්ෂයේ ප්‍රථම කාර්තුවට පෙර පළාත් අධ්‍යක්ෂ විසින් ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය. මෙම වාර්තාව පෙර වසරේ වාර්ෂික සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ලබාගත් ප්‍රතිඵල සහ දුර්වලතාවයන් සංඛ්‍යා ලේඛන සමගින් හඳුනාගත යුතු අතර හඳුනාගන්නා ලද කුමන හෝ දුර්වලතාවයක් නිවැරදි කර ගැනීම සඳහා නිර්ණායකයන් නිර්දේශ කළ යුතු ය. පළාතේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ වාර්ෂික වර්තාව.

8. පළාත් අධ්‍යක්ෂ ලිඛිත දැන්වීමක් මගින් උතුරු පළාතේ ඇති සියලුම පළාත් පාලන අධිකාරීන් ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශයට අදාළ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ අවශ්‍යවන විස්තර සහ තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටිය හැකි අතර, එකී පළාත් පාලන අධිකාරීන් එවැනි දැන්වීමක් මගින් කරනු ලබන ඉල්ලීමකට නියමිත තොරතුරු ලබාදී සහාය දැක්විය යුතු ය. පළාත් පාලන බල ප්‍රදේශ තුළ සෞඛ්‍ය කටයුතු.

9 (1) මෙම ප්‍රඥප්තියෙහි ඇතුළත් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ ඕනෑම කාරණයක් සඳහාම අමාත්‍යවරයා විසින් රීති පැනවිය හැකිය. නැතහොත් මෙම ප්‍රඥප්තිය මගින් බලතල පවරන ලද හෝ අවශ්‍යවන්නාවූ රීති පැනවිය හැකි ය. රීති පැනවීම සඳහා අමාත්‍යවරයා සතු බලතල.

(2) මෙම වගන්තිය යටතේ පනවනු ලබන සෑම රීතියක්ම *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දිනයේ සිට හෝ ප්‍රකාශිත වෙනත් දිනයක සිට ක්‍රියාත්මක කළ යුතු ය.

(3) *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර මාස තුනක් ඇතුළත අමාත්‍යවරයා විසින් එකී රීතීන් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. ඉහත සඳහන් කළ පරිදි අනුමත නොකරන ලද ඕනෑම රීතියක්ම එය අනුමත නොකරන ලද දිනයේ සිට ප්‍රතික්ෂේප කරන ලද බවට සැලකිය යුතුවේ. එහෙයින් එවැනි ප්‍රතික්ෂේප කරන ලදැයි කියන රීතිය යටතේ පෙර ගන්නා ලද කුමන හෝ ක්‍රියාකාරකම්වලට බාධාවක් නොවිය යුතු ය. ඕනෑම රීතියක්ම ප්‍රතික්ෂේප කරන ලදැයි සළකන දිනය *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත්කළ යුතු ය.

**11 කොටස**

*පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාව සහ රෝහල් සංවර්ධන කමිටු*

පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාව.

10 (1) පළාත් සෞඛ්‍යය සේවා උපදේශක සභාවක් (මින් පසු "උපදේශක සභාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.) ඇති කළ යුතු ය.

(2) මෙම උපදේශක සභාවට අමාත්‍යවරයා විසින් පත්කළ යුතු අතර, එය පහත සඳහන් විධිවිධානවලට අනුව සාමාජිකයන් 19 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හෙවත්,

(i) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
(ii) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(iii) පළාත් පාලන කොමසාරිස්
(iv) පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
(v) පළාත් දේශීය වෛද්‍ය අධ්‍යක්ෂ
(vi) එක් එක් සෞඛ්‍ය ප්‍රාදේශීය බල ප්‍රදේශයන්ට වගකිව යුතු ප්‍රාදේශීය සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂවරයෙකු සහ,

(ආ) "පත්කරන ලද සාමාජිකයන්" වශයෙන් පහත සඳහන් තැනැත්තන් අදහස් කෙරේ.

(i) 3 වැනි වගන්තියේ (අ) සහ (ආ) උප වගන්තිවල දැක්වෙන රෝහල්වල සහ අනෙකුත් සෞඛ්‍ය ආයතනවලින් වෛද්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයන් අතුරෙන් සාමාජිකයන් හතර දෙනෙකු විශේෂයෙන්, පිළිවෙලින් සමාජ වෛද්‍ය, පොදු වෛද්‍ය, ගර්භනී සහ ළමා රෝග ක්ෂේත්‍රයන්හි නියුතු වූවන් ;

(ii) යාපනය, මුලතිව්, කිළිනොච්චිය, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්ක පිළිවෙලින් නියෝජනය කිරීම සඳහා සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතුවල නියුතු සාමාජිකයන් පස් දෙනෙකු ;

(3) උපදේශක සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත්කරන ලද හෝ සාමාජිකයෙකු වශයෙන් අඛණ්ඩව සිටීමට හෝ නුසුදුසු තැනැත්තන් ;

(අ) ශ්‍රී ලාංකික පුරවැසිභාවය නොමැතිවිටක,

(ආ) වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූවන්,

(ඇ) පාර්ලිමේන්තු හෝ කිසියම් පළාත් සභාවක හෝ කිසියම් පළාත් පාලන ආයතනයක නියෝජිතයෙකුව සිටීම හෝ තේරීපත්වීම,

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් රටක ක්‍රියාත්මක වන නීතියක් යටතේ බංකොලොත්කරුවෙකුවීම හෝ ණයකරුවෙකු වශයෙන් ප්‍රකාශයට පත්කර තිබීම,

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් රටක ක්‍රියාත්මක වන නීතියක් යටතේ චිත්ත ස්වාධීන නොවන බවට ප්‍රකාශයට පත්කර තිබීම,

(ඊ) දුෂ්චරිතය සම්බන්ධයෙන් කිසියම් වැරැද්දකට හෝ මාස හයකට නොඅඩු දඬුවමකට යටත්වූ තැනැත්තෙකු,

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් රටක ක්‍රියාත්මක වන නීතියක් යටතේ සිරදඬුවම් ලැබූවෙකු හෝ සිරදඬුවම් විඳිමින් සිටින තැනැත්තෙකු.

(4) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ උපදේශක සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කළයුතු අතර උපදේශක සභාවේ ලේකම් උපදේශක සභාවේ සාමාජිකයන් අතුරෙන් තෝරාපත් කරගත යුතු ය.

(5) නිල බලයෙන් තේරී පත්වන එක් එක් සාමාජිකයාගේ නිල කාලය යනුවෙන් සඳහන් කරනුයේ උපදේශක සභාවේ ඔහු සාමාජිකත්වය දැරීමට ඔහු සුදුසුකම් දරන ලද තනතුරේ සේවය කරන තාක් පමණක් විය යුතු ය.

(6) සෑම සාමාජිකයෙකුටම එක් ඡන්දයක් පාවිච්චි කිරීමට හිමිකම් ඇත. ඡන්ද සංඛ්‍යාව සමානවන අවස්ථාවක දී සභාපතිවරයාට තම ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් තිබේ.

(7) පත්කරන ලද සාමාජිකයෙකු අමාත්‍යවරයා අමතා ලිඛිතව දැන්වීමකින් පසුව තනතුරෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයෙකු කරුණු දැක්වීමකින් පසු ඉවත් කළ හැකි ය.

(9) උප වගන්ති (7) සහ (8) අනුව පත් කරන ලද සාමාජිකයෙකුගේ නිල කාලය අවුරුදු දෙකක් විය යුතු ය.

(10) ගිවිසගත් කාලය අවසන් වන සාමාජිකයෙකු නැවත වරක් පත් කිරීමට සුදුසුකම් ඇත්තෙකු විය යුතු ය.

(11) පත් කරන ලද සාමාජිකයෙකු තනතුරෙන් ඉල්ලා අස්වීම, මරණය හෝ අමාත්‍යවරයා විසින් ඉවත් කිරීම හෝ වෙනත් ආකාරයකින් තනතුර අත්හැර ගියහොත් 2 (ආ) උප වගන්තියේ විධිවිධාන අවධානයට ගෙන එකී පුරප්පාඩුව පිරවීමට වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත්කළ හැකි ය. එලෙස පත් කරනු ලබන අය තමාට පෙර සිටි අයගේ නිල කාලයෙන් ඉතිරි වී ඇති කාලයට පමණක් තනතුර දැරිය යුතු ය.

(12) උපදේශක සභාව අවම වශයෙන් මාස තුනකට වරක් හෝ අවශ්‍ය වන්නාවූ විටෙක රැස්විය යුතු ය.

(13) සභාවේ ලේකම් උපදේශන සභා රැස්වීම්වලට කැඳවීම් කළයුතු අතර උපදේශක සභා රැස්වීම් වාර්තා පවත්වා ගෙන ආ යුතු ය.

(14) උපදේශක සභාවේ ගණපූර්ණය දාහතර දෙනෙකු (14) විය යුතු ය.

(15) උපදේශක සභාවේ රැස්වීම්වලට සහභාගිවන සාමාජිකයන්ට දීමනා ගෙවිය යුතු අතර එවැනි දීමනා ආණ්ඩුකාරවරයාගේ එකඟත්වයත්, පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කළ යුතු ය.

11 පළාතේ ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය නැංවීම සඳහාත්, ආරක්ෂා කිරීම සඳහාත්, සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවන්වල ප්‍රගතිය සඳහා අමාත්‍යවරයා විසින් උපදේශන සභාවට එහි උපදේශනය සඳහා යවන ලද කරුණු පිළිබඳව නිර්දේශයන් සහ නිරීක්ෂණ යැවීම උපදේශන සභාවේ වගකීම විය යුතු ය. උපදේශක සභාවේ කටයුතු.

12 (1) තුන්වැනි කොටසේ (අ) සහ (ආ) යන උපවගන්තිවල සඳහන් කරන ලද රෝහලේ සහ වෙනත් සෞඛ්‍ය මධ්‍යස්ථානවල සංවර්ධනය සඳහා රෝහල් සංවර්ධන කමිටුවට පහත සඳහන් තැනැත්තන් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ලේකම්වරයා විසින් පත්කළ හැකි ය. රෝහල් සංවර්ධන කමිටු.

(2) උපවගන්තිය (1) යටතේ එක් එක් රෝහලක සංවර්ධන කමිටු සඳහා පත්කරනු ලබන තැනැත්තන් පහත සඳහන් අයගෙන් සමන්විය යුතු ය.

(අ) නිලනාමයෙන් පත්වන සාමාජිකයන් හෙවත්,

(i) ආයතනය භාරව සිටින වෛද්‍යවරයා,
(ii) රෝහල පිහිටි අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්,
(iii) කාර්මික නිලධාරි තනතුරට නොඅඩු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු,
(iv) රෝහල පිහිටි අදාළ ප්‍රදේශයේ පරිපාලන බල ප්‍රදේශයට අදාළ පළාත් පාලන ආයතනයේ ලේකම් හෝ කොමසාරිස් සහ,

(ආ) "පත්කළ සාමාජිකයෙකු" යටතේ දැක්වෙන සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන් හැඳින්වේ.

(i) එකී ආයතනයේ සේවකයන් අතුරෙන් නියෝජිතයන් හතරදෙනෙකු
(ii) රෝහල පිහිටි අදාළ ප්‍රදේශයේ සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතුවල දීර්ඝ කාලයක් නියැලී හය දෙනෙකුට (06) නොඅඩු තැනැත්තන්,

(3) සංවර්ධන කමිටුවෙ සාමාජිකයන් වශයෙන් පත්කරනු ලබන්නන් හෝ සාමාජිකයන් වශයෙන් අඛණ්ඩ සිටීමට හෝ නුසුදුසු තැනැත්තන්,

(අ) ශ්‍රී ලාංකික පුරවැසිභාවය නොමැතිවිටක,

(ආ) වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූවන්,

(ඇ) පාර්ලිමේන්තු හෝ කිසියම් පළාත් සභාවක හෝ කිසියම් පළාත් පාලන ආයතනයක නියෝජිතයෙකුව සිටීම හෝ තේරීපත්වීම

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් රටක ක්‍රියාත්මක වන නීතියක් යටතේ බංකොලොත්කරුවෙකුවීම හෝ ණයකරුවෙකු වශයෙන් ප්‍රකාශයට පත්කර තිබීම,

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් රටක ක්‍රියාත්මක වන නීතියක් යටතේ චිත්ත ස්වාධීන නොවන බවට ප්‍රකාශයට පත්කර තිබීම,

(ඊ) දුෂ්චරිතය සම්බන්ධයෙන් කිසියම් වැරැද්දකට හෝ මාස හයකට නොඅඩු දඬුවමකට යටත් වූ තැනැත්තෙකු,

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් රටක ක්‍රියාත්මක වන නීතියක් යටතේ සිරදඬුවම් ලැබූවෙකු හෝ සිරදඬුවම් විඳිමින් සිටින තැනැත්තෙකු,

(4) නිල බලයෙන් තේරීපත්වන සාමාජිකයන් රෝහල් සංවර්ධන කමිටුවට පත්වීමට සුදුසුකම් ලැබූ තනතුර දරනතාක් එම නිළය දැරිය යුතු ය.

(5) සෑම සාමාජිකයෙකුටම එක් ඡන්දයක් පාවිච්චි කිරීමට හිමිකම් ඇත. ඡන්ද සංඛ්‍යාව සමානවන අවස්ථාවක දී සභාපතිවරයාට තම ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් තිබේ.

(6) පත්කරන ලද සාමාජිකයකු ලේකම්වරයා අමතා ලිඛිතව දැන්වීමකින් පසුව තනතුරෙන් ඉල්ලා අස්විය හැකි ය.

(7) ලේකම්වරයා විසින් පත් කරන ලද සාමාජිකයෙකු කරුණු දැක්වීමකින් පසු ඉවත් කළ හැකි ය.

(8) උප වගන්ති (6) සහ (7) අනුව පත් කරන ලද සාමාජිකයෙකු ගේ නිල කාලය අවුරුදු දෙකක් විය යුතු ය.

(9) ගිවිසුම අනුව ගිවිසගත් කාලය අවසන්වන සාමාජිකයෙකු නැවත වරක් පත් කිරීමට සුදුසුකම් ඇත්තෙකු විය යුතු ය.

(10) පත්කරන ලද සාමාජිකයෙකු තනතුරෙන් ඉල්ලා අස්වීම, මරණය හෝ අමාත්‍යවරයා විසින් ඉවත් කිරීම හෝ වෙනත් ආකාරයකින් තනතුර අත්හැර ගියහොත් 2 (ආ) උපවගන්තියේ විධිවිධාන අවධානයට ගෙන

එකී පුරප්පාඩුව පිරවීමට වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත්කළ හැකි ය. එලෙස පත් කරනු ලබන අය තමාට පෙර සිටි අයගේ නිල කාලයෙන් ඉතිරි වී ඇති කාලයට පමණක් තනතුර දැරිය යුතු ය.

(11) 2 වැනි වගන්තියේ (අ) උප වගන්තියෙහි සඳහන් රෝහල භාරව සිටින වෛද්‍ය නිලධාරියා එම රෝහලට පත්කරන ලද රෝහල් සංවර්ධන කමිටුවේ සභාපතිවරයා ලෙස සිටිය යුතු ය. සාමාජිකයන්ගේ ඡන්දයෙන් තෝරාපත් කර ගන්නා අයෙකු රෝහල් සංවර්ධන කමිටුවේ ලේකම්වරයා විය යුතුය. රැස්වීම් වාර්තා කමිටු ලේකම්වරයා විසින් පවත්වා ගෙන යා යුතු ය.

(12) කිසියම් ආයතනයක් සඳහා පත්කරනු ලබන එක් එක් සංවර්ධන කමිටුවක් සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව අදාළ ආයතනයේ සංවර්ධන කටයුතු සහ නිර්මාණ කටයුතු ක්‍රියාත්මක කළ හැකි ය.

(13) මෙම ප්‍රඥප්තිය බලාත්මකවීමට පෙර රෝහලක දැනටමත් ස්ථාපිත කර ඇති රෝහල්වල සංවර්ධන කමිටු සියලුම අවශ්‍යතාවයන් සඳහා මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරන ලද කමිටුවක් ලෙස අදහස් කළ හැකි ය. මෙම ප්‍රඥප්තියේ 1 වැනි උප වගන්තියෙහි දැක්වෙන පරිදි මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව නව කමිටුවක් පත්කර ගන්නා තෙක් එවැනි කමිටුවක සාමාජිකයන් රෝහල් සංවර්ධන කමිටුවේ සාමාජිකයන් වශයෙන් තනතුරු දැරිය හැකි ය.

*111 කොටස - පොදු*

13 තුන්වැනි කොටසේ (අ) සහ (ආ) යන උපවගන්තිවල සඳහන් කරන ලද රෝහල් සහ වෙනත් සෞඛ්‍ය මධ්‍යස්ථාවලින් සපයනු ලබන සේවාවන් සියල්ලම කිසිදු ගාස්තුවක් අය නොකිරීමෙන් සැපයිය යුතු ය. නොමිළයේ සෞඛ්‍ය සේවාවන්.

14 මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ පාඨ අතර යම් අනනුකූල තත්ත්වයක් පැන නැඟුන හොත් දෙමළ පාඨය බල පැවැත්විය යුතුවේ. භාෂා අතර අසමානකම්.

15 මෙම ප්‍රඥප්තියේ අවස්ථා අන්‍යාකාරයකින් අවශ්‍ය වුවහොත් හැර, "දෙපාර්තමේන්තුව" උතුරු පළාතේ සෞඛ්‍ය සේවා පළාත් දෙපාර්තමේන්තුව අදහස් කෙරේ. අර්ථ නිරූපන.

"පළාත් පාලන අධිකාරිය" යනුවෙන් උතුරු පළාත තුළ ක්‍රියාත්මක වන මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් කෙරේ.

"ආණ්ඩුකාරවරයා" යනු උතුරු පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් කෙරේ.

"වෛද්‍ය වෘත්තීය ප්‍රවීණයෝ" වෛද්‍ය ආඥාපනත අනුව ලියාපදිංචි වී ඇති වෛද්‍යවරයෙක් අදහස් කෙරේ.

"අමාත්‍යවරයා" යනු උතුරු පළාතේ අමාත්‍ය මණ්ඩලයේ සෞඛ්‍ය විෂය භාර පළාත් අමාත්‍යවරයා ලෙස අදහස් කෙරේ.

"පළාත" යනු යාපනය, කිළිනොච්චිය, මන්නාරම, වවුනියාව සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක ඇතුළත් උතුරු පළාත අදහස් කෙරේ.

"පළාත් අධ්‍යක්ෂ" යනු උතුරු පළාතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ අදහස් කෙරේ.

"පළාත් අතිරේක අධ්‍යක්ෂ" යනු උතුරු පළාතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් අතිරේක අධ්‍යක්ෂ අදහස් කෙරේ.

"පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ" යනු උතුරු පළාතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ අදහස් කෙරේ.

"ලේකම්" යනු උතුරු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම් අදහස් කෙරේ.

*ඇමුණුම - I*

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය ආයතන, උතුරු පළාත

**ප්‍රතිකාර කරන අංශ**

| *රෝහල් වර්ගය* | *යාපනය දිස්ත්‍රික්කය* | *කිළිනොච්චිය දිස්ත්‍රික්කය* | *මුලතිව් දිස්ත්‍රික්කය* | *වවුනියාව දිස්ත්‍රික්කය* | *මන්නාරම දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|---|
| මහ රෝහල | - | 1. කිළිනොච්චිය | 1. මුලතිව් | 1. වවුනියාව | 1. මන්නාරම |
| මූලික රෝහල් A - වර්ගය | 1. තෙල්ලිපලෙයි<br>2. පේදුරුතුඩුව | - | - | - | |
| මූලික රෝහල් B - වර්ගය | 1. චාවකච්චේරිය<br>2. කයිට්ස් | 1. මුලන්කාවිල් | 1. මාන්කුලම<br>2. මල්ලාව | 1. චෙට්ටිකුලම් | - |
| ප්‍රාදේශීය රෝහල් A - වර්ගය | 1. අච්චුවේලි<br>2. සන්කානෙයි<br>3. කොපායි<br>4. වැල්වැටිතුරෙයි | 1. අක්කරායන්කුලම් | 1. පුදුකුඩ්ඉරිප්පු<br>3. සම්පත් නුවර | - | 1. සිලාවතුරෙයි<br>2. මුරුන්ගන්<br>3. තලෙයිමන්නාරම |
| ප්‍රාදේශීය රෝහල් B - වර්ගය | 1. වේලනෙයි | 1. පූනගරි | 1. ඔඩ්ඩුසුඩ්ඩාන්<br>2. නට්ටාන්කණ්ඩාල් | 1. නෙඩුන්කර්ණි | 1. අඩම්පන්<br>2. පේසාලෙයි<br>3. චෙඩිතලතිව් |
| ප්‍රාදේශීය රෝහල් C - වර්ගය | 1. ඩෙල්ෆ්<br>2. පුන්ගුඩුතිව්<br>3. අනලතිව්<br>4. කාරෙයිනගර්<br>5. නයිනාතිව්<br>6. මරුදන්කර්ණි<br>7. වඩ්ඩුකොඩෙයි<br>8. පණ්ඩතරිප්පු<br>9. අලවෙඩ්ඩි<br>10. අම්පාන්<br>11. ගුරුනගර්<br>12. කරවෙඩ්ඩි<br>13. කොඩිගාමම්<br>14. කොණ්ඩාවිල්<br>15. මණ්ඩතිව්<br>16. මානිප්පායි<br>17. වරණි<br>18. ඉලවාලෙයි | 1. පලෙයි<br>2. ධර්මපුරම්<br>3. උරුත්තිරපුලම්<br>4. වීරාවිල්<br>5. වඩ්ඩකච්චි | 1. උනාපුලව්<br>2. අලම්පිල්<br>3. කොකිලායි<br>4. මූන්ගිලාරු | 1. උලුක්කුලම්<br>2. පාවට්කුලම්<br>3. පූවරසන්කුලම්<br>4. නේරියකුලම්<br>5. සිදම්බරපුරම්<br>6. පුලියන්කුලම්<br>7. මාමඩුව | 1. එරුක්කලම්පිට්ටි<br>2. වන්කාලෙයි<br>3. නානාට්ටන්<br>4. පෙරිය පණ්ඩිවිරිච්චාන් |
| ප්‍රාථමික වෛද්‍ය උපවැන් මධ්‍යස්ථාන | 1. චුන්නාකම්<br>2. ඒලාලෙයි<br>3. ඉනුවිල්<br>4. කයිතඩි<br>5. කන්කසන්තුරෙයි<br>6. කොකුවිල්<br>7. පලාලි<br>8. පේදුරුතුඩුව<br>9. පුන්නාලෙයි කඩ්ඩුවාන්<br>10. පුත්තූර්<br>11. තෝල්පුරම්<br>12. උඩුවිල් | 1. අලිමංකඩ<br>2. ඉරණතිවී (ජෙයපුරම්)<br>3. කණ්ඩාවලෙයි<br>4. වන්නේරිකුලම් | 1. අයියන්කන්කුලම්<br>2. තුණුකායි<br>3. මුල්ලියාවලෙයි<br>4. කිරිඉබ්බන්වැව<br>5. අම්බලවාන් පොක්කනෙයි<br>6. කරිප්පඩ්ඩමුරිප්පු | 1. මිමන්දෙයි<br>2. සුඩුවෙන්දපුලව් | 1. ඉරණෛඉලුප්පෙයි කුලම්<br>2. මරුච්චුකඩ්ඩු<br>3. තරුකේදීස්වරන්<br>4. වෙල්ලන්කුලම්<br>5. පෙරියමඩු<br>6. තාරාපුරම්<br>7. වේප්පන්කුලම්<br>8. පණ්ඩාරවේලී |

උපලේඛනය (සම්බන්ධිතයි)

| රෝහල් වර්ගය | යාපනය දිස්ත්‍රික්කය | කිළානොච්චිය දිස්ත්‍රික්කය | මුලතිව් දිස්ත්‍රික්කය | වවුනියාව දිස්ත්‍රික්කය | මන්නාරම දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| | 13. උරුම්පිරායි<br>14. මුල්ලියාන්<br>15. වඩ්ඩුකෝඩ්ඩයි<br>16. එලුවෙයිතිව්<br>17. පණ්ණෙයි (යාපනය) | | | | |
| ළය රෝහල | 1. යාපනය | 1. කිළිනොච්චිය | 1. මුලතිව් | 1. වවුනියාව | 1. මන්නාරම |
| දන්ත රෝ.වැ. සායන | - | 1. කිළිනොච්චිය | 1. මුලතිව් | 1. වවුනියාව | 1. මන්නාරම |

නිවාරණ අංශ

| රෝහල් වර්ගය | යාපනය දිස්ත්‍රික්කය | කිළිනොච්චිය දිස්ත්‍රික්කය | මුලතිව් දිස්ත්‍රික්කය | වවුනියාව දිස්ත්‍රික්කය | මන්නාරම දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය | 1. චාවකච්චේරි<br>2. පේද්‍රුරුතුඩුව<br>3. කයිට්ස්<br>4. තෙල්ලිපලෙයි<br>5. සන්දිලිපායි<br>6. කෝපායි<br>7. වේලනෙයි<br>8. නල්ලූර්<br>9. උඩුවිල්<br>10. චන්කානෙයි<br>11. කරවෙඩ්ඩි | 1. කිළිනොච්චිය<br>2. පුනගරි<br>3. කණ්ඩාවලෙයි<br>4. පලෙයි | 1. මුලතිව්<br>2. මල්ලාවි<br>3. පුදුකුඩ්ඉරුප්පු<br>4. ඔඩ්ඩුසුඩ්ඩාන්<br>5. සම්පත්නුවර | 1. වවුනියාව<br>2. වෙඩ්ඩිකුලම්<br>3. වවුනියාව දකුණ<br>4. වවුනියාව උතුර | 1. මන්නාරම<br>2. නානාට්ටාන්<br>3. මාන්තෙයි බටහිර<br>4. මුසලි<br>5. මඩු |
| මැලේරිය, මර්දන ව්‍යාපාරය සහ ඉසින ස්ථාන (SPC) | 1. යාපනය | 1. කිළිනොච්චිය | 1. මුලිතිව් | 1. වවුනියාව | 1. මන්නාරම |
| පාසැල් දන්ත සායන | 1. මධ්‍ය මහා විද්‍යාලය, යාපනය<br>2. ඩ්‍රිබෙග් විද්‍යාලය, චාවකච්චේරිය<br>3. ශාන්ත ජෝන්ස් විද්‍යාලය, යාපනය<br>4. රාමනාදන් විද්‍යාලය, චුන්නාකම්<br>5. බාළිකා උසස් විද්‍යාලය, උඩුප්පිඩ්ඩි<br>6. හින්දු විද්‍යාලය, මානිප්පායි<br>7. පා.ද.සා., දි. රෝ., කෝණ්ඩාවිල්<br>8. පා.ද.සැ. දි.රො., වේලනෙයි<br>9. සෞ.ම. වජිප්‍රකෝඩ් ඩෙයි<br>10. අලබෙජ්ජි ආයුර්වේද විද්‍යාලය | 2. කිළිනොච්චි මහා විද්‍යාලය | 1. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මුලතිව් | 1. රම්බෙයිකුලම් බා.ම.වි.<br>2. වවුනියාව දෙමළ ම.ම.වි.<br>3. වවුනියා මුස්ලිම් ම.ම.වි.<br>4. වවුනියා කෝවිල් කුලම්, පුදුකුලම් වි. | 1. වැ ද. සා, ශා. සේවරියර් බාලිකා විද්‍යාලය, මන්නාරම<br>2. වැ.ද.සා, ශාන්තිව් නායගර් හින්දු විද්‍යාලය, මන්නාරම<br>3. වැ.ද.සා, අල්-අෂාර් මහා විද්‍යාලය, මන්නාරම.<br>4. වැ.ද.සා, ශාන්ත ඇන්ස් මධ්‍ය මහා විද්‍යාලය, වන්කාලෙයි |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *රෝහල් වර්ගය* | *යාපනය දිස්ත්‍රික්කය* | *කිලිනොච්චිය දිස්ත්‍රික්කය* | *මුලතිව් දිස්ත්‍රික්කය* | *වවුනියාව දිස්ත්‍රික්කය* | *මන්නාරම දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|---|
| ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන | **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, චාවකච්චේරිය**<br>1. කච්චායි<br>2. උසාන්<br>3. මන්දුවිල්<br>4. මඩ්ඩුවිල් දකුන<br>5. මරවාන්පුලෝ<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, සන්කානෙයි**<br>පන්නාගම්<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, පේදුරුතුඩුව**<br>1. වියාපාරිමූලෙයි<br>2. තික්කම්<br>3. අදියඩි<br>4. තුම්පාලෙයි නැගෙනහිර<br>5. කට්කෝවාලම්<br>6. මනල්කඩ්ඩු<br>7. කුඩත්තානෙයි<br>8. තොන්ඩමනාරු<br>9. උඩුත්තුරෙයි<br>10. මමුනෙයි<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, කයිට්ස්**<br>1. අල්ලායිපිඩි<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, සන්දිලිපායි**<br>1. චාවල්කාඩු<br>2. මුල්ලි<br>3. ප්‍රාන්පත්තු<br>4. සිල්ලාලෙයි<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, නල්ලූර්**<br>1. අරියාලෙයි | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, කරච්චි<br>1. සිවනගර්<br>2. ආනෙයිවිලුන්දන්<br>3. පුදමුරිප්පු<br>4. ස්කන්දපුරම්<br>5. සාන්තපුරම්<br>6. යූනියන්කුලම්<br>7. උදයනගර් බටහිර<br>8. රාමනාදන්පුරම්<br>9. කනගාම්බිගෙයි කුලම්<br>10. මලයාලපුරම්<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, කණ්ඩාවලෙයි**<br>1. කල්මඩුනගර්<br>2. පුලියන්පොක්ක<br>3. කල්ලාරු<br>4. උමෙයාල්පුරම්<br>5. පුන්නෙයිතීරාවලි<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, පුනගරි**<br>1. නාච්චිකුඩා<br>2. හතරවැනි සැතපුම් කණුව<br>3. කිරාන්චි<br>4. ඉරනෙයිමාතා නගර්<br>5. තම්බිරාජ්<br>6. ඥාණිමඩම්<br>7. වල්ලෙයිපාඩු<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, පලෙයි**<br>1. අයියකච්චි<br>2. කරන්නායි | **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මුලතිව්**<br>1. කල්ලපාඩු<br>2. සිලාවත්තෙයි<br>3. මුල්ලිවායික්කාල්<br>4. අලම්පිල්<br>5. කුමුලමුනෙයි<br>6. උඩුප්පුකුලම්<br>7. තන්නිඋෟට්රු<br>8. නිරාවිපිට්ටි<br>9. මාමුලෙයි<br>10. වට්ටාපලෙයි<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මල්ලාවි**<br>1. කල්විලාන්<br>2. තෙරන්කන්ඩාල්<br>3. අයියන්කාන්කුලම්<br>4. පාන්ඩියන්කුලම්<br>5. පනන්කාමම්<br>6. පාලිනගර්<br>7. වන්නිවිලාන්කුලම්<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, පුදුකුඩ්ඉරුප්පු**<br>1. ඉරණපාලෙයි<br>2. කෝම්බාවිල්<br>3. කයිවේලි<br>4. වල්ලිපුනම්<br>5. සුදන්දිරපුරම්<br>6. විසුවමඩු නැගෙනහිර<br>7. අම්බලවාන් පෝක්කනෙයි<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, ඔඩ්ඩුසුඩ්ඩාන්**<br>1. කුලාම්පුරිප්පු<br>2. මදියාමලෙයි<br>3. තන්ඩුවාන්<br>4. කට්චිලායිමඩු<br>5. මුත්තායන්කට්ටු වම් ඉවුර<br>6. මුත්තායන්කට්ටු දකුණු ඉවුර<br>7. අම්බකාමම්<br>8. කරිප්පඩ්ඩාමුරිප්පු<br>9. තිරුමුරිකන්ඩි | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, වවුනියාව<br>1. පන්ඩාරිකුලම්<br>2. සමනම්කුලම්<br>3. මහාරම්බෙයිකුලම්<br>4. කුමාන්කුලම්<br>5. රාජේන්ද්‍රකුලම්<br>6. නෙලුක්කුලම්<br>7. ඊච්චන්කුලම්<br>8. සාස්ත්‍රිකුලාන්කුලම්<br>9. පන්රිකයිත්තාකුලම්<br>10. පාලමොඩ්ඩෙයි<br>11. සේමමඩු<br>12. සාන්තසෝලෙයි<br>13. තවසිකුලම්<br>14. සාලම්බෙයිකුලම්<br>15. කදිරවේලාර් පූවාරන්කුලම්<br>16. නොච්චිකුලම (මාළිගෙයි)<br>17. චෙක්කඩිපිලවු<br>18. සමයපුරම්<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, වවුනියාව උතුර**<br>1. කනගරායන්කුල<br>2. නයිනාමඩු<br>3. පුලියන්කුලම්<br>4. කුලවිසුඩ්ඩාන්<br>5. කට්කුලම්<br>6. පණ්ඩිකුඩ්ඉරුප්පු<br>7. සින්නඅඩම්පන්<br>8. නෙඩුන්කර්ණී<br>9. ඔලුමඩු<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, වවුනියාව දකුණ**<br>1. අලගල්ල<br>2. මඩුකන්ද<br>3. අග්බෝපුර<br>4. කැලෑබෝගස්වැව<br>5. රන්කෙත්ගම<br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, වෙඩ්ඩිකුලම**<br>1. වාරිකුට්ටියූර්<br>2. ආන්ඩියාපුලියන් කුලම් | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මන්නාරම<br>1. සින්නකරිසාල්<br>2. පුදුකුඩ්ඉරුප්පු<br>3. තාල්වුපාඩු<br>4. පල්ලාමුණෙයි<br>5. තාරාපුරම්<br>6. තලෙයිමන්නාරම පියර්<br>7. එරුකලම්පිඩ්ඩි<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, නානාට්ටාන්**<br>1.මඩුක්කාරෙයි<br>2.නඩ්වානගර්<br>3.කට්කඩන්දාකුලම්<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මුසලි**<br>1. අරිප්පු<br>2. පලෙයිකුලි<br>3. කොණ්ඩායිච්චි<br>4. අගදිමුරිප්පු<br>5. පොට්කර්ණී<br>6. තම්පට්ටාම්මුසලි<br>7. පුදුවේලි<br>8. පිච්චවානිකුලම්<br>9. කරම්ක්කුලි<br>10. සාන්තාර්<br><br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මාන්තෙයි බටහිර**<br>1. වෙඩිතලතිව් බටහිර<br>2. ඉලුප්පුන්කඩවායි<br>3. මුන්රාම්පිඩි<br>4. වඩකණ්ඩාල්<br>5. ඊච්චිලවාකෙයි<br>6. වදිමඩෙයි<br>7. පේයියාමඩු නැගෙනහිර<br>8. සෝර්ණපුර |

උපලේඛනය (සම්බන්ධිතයි)

| රෝහල් වර්ගය | යාපනය දිස්ත්‍රික්කය | කිළිනොච්චිය දිස්ත්‍රික්කය | මුලතිව් දිස්ත්‍රික්කය | වවුනියාව දිස්ත්‍රික්කය | මන්නාරම දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| | **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, උඩුවිල්**<br>1. තාවඩි<br>2. සන්ගුවේලි<br>3. එව්නෙයි<br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, කෝපායි**<br>1. උරේල<br>2. නීර්වේලි<br>3. අට්චේලු<br>4. වදරවදෙයි<br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, කරවෙඩ්ඩි**<br>1. කෝට්ටාවදෙහි<br>**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, තෙල්ලිපලෙයි**<br>1. අලවෙඩ්ඩා<br>2. සිතගපුරම්<br>3. සෙනාන්කාලඩ්ඩි<br>4. කුඩ්ඩියාපුලම්<br>5. කුලමන්ගල් | | **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, වැලිඔය**<br>1. ජනකපුර<br>2. සම්පත් නුවර<br>3. ඇතාවැටුනවැව | 3. ගනේසපුරම්<br>4. තඩ්ඩාන්කුලම් යෝජනාක්‍රමය<br>5. මනියර්කුලම් යෝජනාක්‍රමය<br>6. මැණික්පාම්<br>7. මුදලියාර්කුලම් | **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, මඩු**<br>1. පෙරිය පාණෝඩ් විරිච්චාන්<br>2. සින්නවාලයාන් කඩ්ඩු<br>3. කුන්චිකුලම්<br>4. කඩ්ඩෙයිඅඩප්පන්<br>5. තච්චනාමරුදමඩු |

**විශේෂ සේවා ඒකක**

| ආයතන වර්ගය | යාපනය දිස්ත්‍රික්කය | කිළිනොච්චිය දිස්ත්‍රික්කය | මුලතිව් දිස්ත්‍රික්කය | වවුනියාව දිස්ත්‍රික්කය | මන්නාරම දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|
| පිළිකා රෝහල | 1. තෙල්ලිප්පලෙයි | - | - | - | - |
| කොඳු ඇටපෙල සහ තුවාල මධ්‍යස්ථානය | - | - | - | 1. වවුනියාව | - |
| ශරීරාබාධ ප්‍රකෘතිමත් කිරීම සහ විකලාංග මධ්‍යස්ථාන | - | 1. කිළිනොච්චි | - | 1. වවුනියාව | - |

**පුහුණු මධ්‍යස්ථාන**

| *ආයතන වර්ගය* | *යාපනය දිස්ත්‍රික්කය* | *කිළිනොච්චිය දිස්ත්‍රික්කය* | *මුලතිව් දිස්ත්‍රික්කය* | *වවුනියාව දිස්ත්‍රික්කය* | *මන්නාරම දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය | 1. පණ්ණෙයි (යාපනය) | - | - | - | - |
| හෙදි විදුහල | - | - | - | 1. වවුනියාව | - |

**මහජනතාව පදනම් කරගත් ආයතන**

| *ආයතන වර්ගය* | *යාපනය දිස්ත්‍රික්කය* | *කිළිනොච්චිය දිස්ත්‍රික්කය* | *මුලතිව් දිස්ත්‍රික්කය* | *වවුනියාව දිස්ත්‍රික්කය* | *මන්නාරම දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|---|
| මානසික සෞඛ්‍ය අන්තර් කාලීන සුවකිරීමේ ඒකක | 1. තෙල්ලිප්පලෙයි<br>2. පේදුරුතුඩුව | - | - | 1. වෙඩිඩිකුලම් | - |
| මානසික සෞඛ්‍ය දීර්ඝකාලීන සුව කිරීමේ ඒකක | 1. තෙල්ලිප්පලෙයි | - | - | - | - |
| ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන | 1. චාවකච්චේරිය | - | - | - | - |
| මානසික සෞඛ්‍ය උපකාරක මහජන මධ්‍යස්ථාන | 1. මරුදන්කර්ණි | 1. මලයාම්පුරම්<br>2. පුනගරි<br>3. ධර්මපුරම් | 1. තීරාවිල්<br>2. තුණුකායි<br>3. මුල්ලියාවලෙයි | 1. මරුතෝඩෙයි | 1. අඩම්පන්<br>2. මුසලි |

03 - 222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.